# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
## DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephon: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ.இ.419, இல. 330, யூனியன் ப்ளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல / My No: ස.සං.දෙ./නීති/01/16/1

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.12. 08

චක්‍රලේඛ අංක - 05/2020 (නීති)

මුදුන් මට්ටමේ සමුපකාර සමිති / සංගම් සහ දීප ව්‍යාප්ත සමුපකාර සමිතිවල
ගරු සභාපතිවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභා සාමාජිකයින්,

**<u>සමුපකාර සමිති / සංගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම.</u>**

1983 අංක 32 සහ 1992 අංක 11 දරන සංශෝධිත පනත් සමඟ කියැවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ

I. 43 අ (1) වගන්තියෙහි "සෑම ලියාපදිංචි සමිතියක්ම සමිතියේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය'',යනුවෙන්ද,

II. 43 අ (2) වගන්තියෙහි "රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි සමිතියේ කටයුතු වලට අදාල ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් ප්‍රකාශය එය අදාලවන මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුලත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.'' යනුවෙන්ද සඳහන් වේ.

02. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති /සංගම් කිහිපයක් තම සමිතියේ /සංගමයේ මුදල් වර්ෂය අවසන් වූ පසු, එකී මුදල් වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශයන් ඉහත සඳහන් පරිදි නිශ්චිත කාලසීමාව තුල දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු නොලබන බව නිරීක්ෂණය වේ.

03. තවද සමුපකාර සමිතියක /සංගමයක ගිණුම්, නීතියේ විධිවිධාන ප්‍රකාරව විගණනය සඳහා ඉදිරිපත් කිරීම එකී සමිතියේ /සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ /කාරක සභාවේ වගකීමක් වන අතර , සමුපකාර සමිති පනතේ 43.අ.(3) වගන්තිය අනුව ඉහත විධිවිධාන යටතේ කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් /සංගමයක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ සමිතියේ /සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කළ හැකිවේ.

04. ඒ බැවින් සියලුම සමුපකාර සමිති /සංගම් මින් ඉදිරියට තම සමිතියේ / සංගමයේ මුදල් වර්ෂය අවසන් වූ පසු නීතියේ විධිවිධාන පරිදි නිශ්චිත කාලය තුල දෙපාර්තමේන්තුව වෙත ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සමිතියේ / සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයට/ කාරක සභාවට එකී කාර්යයේ වගකීමෙන් නිදහස් වීමට නොහැකි බවත් වැඩිදුරටත් අවධාරණය කරමි.

05. එසේ තම සමිතියේ /සංගමයේ මුදල් වර්ෂය අවසන් වූ පසු සමුපකාර සමිති පනතේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව වෙත ගිණුම් ඉදිරිපත් කරනු නොලබන සමුපකාර සමිති/සංගම් හා ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩලයට /කාරක සභාවට එරෙහිව ඉදිරියේදී නෛතික කටයුතු සිදු කරනු ලබන බව වැඩිදුරටත් දැනුම් දෙමි.

06. තවද 2020.09.30 දින වන විට මුදල් වර්ෂය අවසන් සමුපකාර සමිති/සංගම් විසින් තමන් විසින් ගිණුම් ඉදිරිපත් කර නොමැති මුදල් වර්ෂය /වර්ෂ සඳහා වන ගිණුම් 2020.12.30 වන දින හෝ එදිනට පෙර මෙම දෙපාර්තමේන්තුවේ විගණන අංශය වෙත ගෙනැවිත් භාර දෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

07. ඉන් අනතුරුව 2020.09.30 දිනෙන් පසුව මුදල් වර්ෂය අවසන් වන සෑම සමුපකාර සමිතියක්ම /සංගමයක්ම නීතියේ විධිවිධාන පරිදි , නිශ්චිත කාල සීමාව තුල දී ගිණුම් ඉදිරිපත් නොකළහොත් 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනතේ 43.අ.(2) වගන්තියට අනුකූලව ක්‍රියානොකිරීම මත එකී පනතේ 43.අ.(3) වගන්තිය අනුවත්, එකී පනතේ 72 (1) වගන්තියට අනුකූලව ක්‍රියා නොකිරීම මත 72 (2) වගන්තිය අනුවත් නෛතික ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වමි.

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පිටපත්

1. ලේකම්,
   සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
2. පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් - කරු.දැ.ගැ.පි.
3. අධ්‍යක්ෂ ජනරාල් , ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - කරු.දැ.ගැ.පි.
4. ලේකම් , සමුපකාර සේවක කොමිෂන් සභාව - කරු.දැ.ගැ.පි.
5. සියලුම මාණ්ඩලික නිලධාරීන් - කරු.දැ.ගැ.පි. හා නිලධාරීන් දැනුවත් කිරීම සඳහා